# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2034/33 - 2017 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා - 2017.09.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/81(XII)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

23 ද වගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන වන මම මෙම නියමය මගින් -

1. (i) දේශීය භාවිතය සඳහා ඝනකමින් මයික්‍රෝන විස්ස (20) හෝ ඊට අඩු පොලිතින් හෝ යම් පොලිතින් නිෂ්පාදන නිපදවීම ; හෝ

   (ii) ඝනකමින් මයික්‍රෝන විස්ස (20) හෝ ඊට අඩු පොලිතින් හෝ යම් පොලිතින් නිෂ්පාදන රට තුළ විකිණීම, විකිණීම සඳහා අර්පණය, ප්‍රදර්ශනය, නොමිලේ ලබා දීම හෝ භාවිතය,

   තහනම් කරමි :

   එසේ වුව ද, පහත උපලේඛනයේ නිශ්චිතව සඳහන් අවසර ලත් භාවිතයන් සඳහා ඝනකමින් මයික්‍රෝන විස්ස (20) හෝ ඊට අඩු පොලිතින් හෝ පොලිතින් නිෂ්පාදන අධිකාරියේ පූර්ව අනුමතය සහිතව භාවිත කළ හැකි ය.

2. 2006 ඔක්තෝබර් 10 වැනි දින හා අංක 1466/5 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නියමය, ඒ යටතේ සිදු කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි, මෙයින් පරිච්ඡින්න කරන බවට ප්‍රකාශ කරමි.

මෙම නියමයේ කාර්ය සඳහා -

''අධිකාරිය'' යන්නෙන් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ ස්ථාපනය කරන ලද මධ්‍යම පරිසර අධිකාරිය අදහස් වේ.

''පොලිතින් '' යන්නෙන් සියලු ආකාරයේ පොලිඑතිලින්, පොලිප්‍රොපිලින්, පොලිස්ටයරින්, පොලිවයනයිල් ක්ලෝරයිඩ්, පොලිඑතිලින් ටෙරප්තලේට් හෝ ඒ හා සමාන වෙනත් අමුද්‍රව්‍යයක් අදහස් වේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

*අවසරලත් භාවිතයන්*

1. ලැමිනේට් කිරීම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය භාවිතය :-

   (අ) ලෝහ ආලේපිත හෝ හොලෝග්‍රැෆික වන හෝ නොවන පොලිඑතිලින් ටෙරප්තලේට් (PET) පටල ;

   (ආ) ලෝහ ආලේපිත හෝ පර්ලයිස්ඩ් (pearlized) වන හෝ නොවන පොලිප්‍රොපිලින් (PP) පටල ;

   (ඇ) නයිලෝන් ;

   (ඈ) හැඩ ගන්වන ලද පොලිප්‍රොපිලින් (CPP) හෝ ලෝහ ආලේපිත හැඩ ගන්වන ලද පොලිප්‍රොපිලින් (CPP) ;

   (ඉ) පොලිවයනයිල් ක්ලෝරයිඩ් (PVC) ;

   (ඊ) පොලිඑතිලින් ටෙරප්තලේට් ග්ලයිකෝල් (PETG).

2. වෛද්‍ය විද්‍යාත්මක හෝ ඖෂධමය කාර්ය සඳහා වෙනත් යම් සුදුසු විකල්ප නොමැති අවස්ථාවලදී භාවිතය.

09-361

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.